

2020 මාර්තු 31වන දිනෙන්

අවසන් වූ මුදල් වර්ෂය සඳහා

බීසීසී ලංකා ලිමිටඩ්

වාර්ෂික වාර්තාව

පටුන

01. ආයතනික තොරතුරු ..... **iv**

02. අපගේ දැක්ම හා මෙහෙවර ..... **v**

03. සභාපතිවරයාගේ සමාලෝචනය ..... **vi**

04. අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ..... **vii**

05. සංවිධානය පිළිබඳව ..... **viii**

06. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව ..... **ix**

07. මූල්‍ය වාර්තාව

ස්වාධීන විගණක වාර්තාව .....

ආදායම් ප්‍රකාශය 1

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 2

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය 3

මුදල් ප්‍රවාහය 4

මූල්‍ය තොරතුරු සඳහා වූ සටහන් 5-24

බී.සී.සී. ලංකා සමාගම-පී.බී. 221

ආයතනික තොරතුරු

සමාගමේ නම	-	**බී.සී.සී. ලංකා සමාගම**
සමාගමේ ලියාපදිංචි අංකය	-	පී.බී. 221
ලියාපදිංචි කාර්යාලය	-	**හල්ස්ඩොර්ෆ් මිල්ස්, අංක 21,** මීරානියා වීදිය, කොළඹ12.
ව්‍යාපාරික ලිපිනය	-	**හල්ස්ඩොර්ෆ් මිල්ස්, අංක 21,** මීරානියා වීදිය, කොළඹ12. දුරකථනය: 011-2422111-5 විද්‍යුත් තැපෑල:bcclankaltd@gmail.com
අධ්‍යක්ෂක මණ්ඩලය	-	**2020/03/31 දිනට අධ්‍යක්ෂක මණ්ඩලය පහත පරිදි වේ.** ඩබ්ලිව්.එම්. එස්. සි. වෙලේගම මහතා - සභාපති කේ. බී. ජී. එස්. විමුක්ති මහතා බී. එන්. ඩී. ගුණසේකර මහතා පී. බී. ආර්. කුමාර මහතා ජී. ආර්. එම්. එල්. බණ්ඩාර මහතා එම්. පී. ඩබ්ලිව්. කරුණාරත්න මහතා එම්. ඩී. අයි. අබේගුණවර්ධන මෙනෙවිය (27.07.2020 දින සිට අධ්‍යක්ෂක ධූරය අවසන් කරන පරිදි)
සටහන	-	**වර්ෂය තුලදී පහත සඳහන් අධ්‍යක්ෂකවරුන් ප්‍රතිස්ථාපනය කරන ලදී.** ටී . කේ . එච්. හේමචන්ද්‍ර මහතා - 2019.04.25 දින සිට ආර්. පී. එස්. පුෂ්පකුමාර මහතා - 2020.01.15 දින සිට ඒ. ආර්. වික්‍රමසිංහ මෙනෙවිය - 2020.01.06 දින සිට **ඉල්ලා අස්වීම්** ටී. බී. ජී. විජයගුණවර්ධන මහතා - 2020.02.28 දින සිට ඒ. ජී. ඩී. ද සිල්වා මහතා -2020.02.28 දින සිට අයි. වයි . බී. වීරසූරිය මහතා - 2020.02.28 දින සිට පී. එච්. එන්. සොලමන් මහතා - 2020.02.28 දින සිට ආර්. එම්. සි. එම්. ඒ. රත්නායක මහතා - 2020.02.28 දින සිට
ලේකම්වරු **(පත්කළ දිනය 2013.10.01)**	-	සි/ස එස් එස් පි කෝපරේට් සර්විසස් (පෞද්) සමාගම අංක 101, ඇතුල් මල් පාර, කොළඹ 03.
විගණකවරු	-	**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

අපගේ දැක්ම

“තිරසාරව සංවර්ධිත සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් තුළ, පැරණි වටිනාකම් රැක ගනිමින්, වෙළඳපළ ප්‍රමුඛතම වෙළඳ සන්නාමය බවට පත් වීම”

අපගේ මෙහෙවර

“තිරසාර පරිසරයක්, මූලික වටිනාකම් සහ සේවක තෘප්තිය පවත්වා ගනිමින් පාරිභෝගිකයා තෘප්තිමත් කිරීම ”

බී.සී.සී. ලංකා ලිමිටඩ්

සභාපතිවරයාගේ සමාලෝචනය

(2020 මාර්තු මස 31වන දිනෙන් අවසන් මූදල් වර්ෂය සඳහා)

සභාපතිවරයාගේ ප්‍රකාශය

2020 මාර්තු මස 31වන දිනෙන් අවසන්වූ මුදල් වර්ෂය සඳහා බී.සී.සී. ලංකා සමාගමේ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

සමාගම විසින් විකුණුම් පිරිවැය රුපියල් මිලියන 21.75කින් අඩුකර ගනිමින් රුපියල් මිලියන 109.3 දළ ලාභයක් වාර්තා කරන ලදී. තවද සමාගම විසින් රුපියල් මිලියන 30ක විශිෂ්ඨ බදු පසු ලාභයක් අත්පත් කරගන්නා ලදි.

අඛණ්ඩව ලබාදුන් සහයෝගය සම්බන්ධයෙන් අපගේ විශ්වාසවන්ත හා කැපවූ කාර්ය මණ්ඩලය වෙත මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි. අපගේ කාර්ය සාධනය, ජ්‍යෝෂ්ඨ කළමණාකාරීත්වයේ හා සමස්ථ කාර්ය මණ්ඩලයේ ස්ථිරසාර ප්‍රයත්නයෙහි ප්‍රතිඵලයයි.

කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගෙන් හා ලේකම්වරයාගෙන් ලද නොමසුරු සහයෝගය හා ඥානාන්විත මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පිරිනැමීමට කැමැත්තෙමි.

ඩබ්.එම්.එස්.සී. වෙලේගම

සභාපති

බී.සී.සී. ලංකා සමාගම

බී.සී.සී. ලංකා සමාගම – පී.බී. 221

සමාගමේ කටයුතු පිළිබඳව
අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

බී.සී.සී. ලංකා සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2020 මාර්තු 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන, සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සමඟ වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත.

වර්ෂයේ ප්‍රතිඵල

මුදල් වර්ෂය තුළදී මෙහෙයුම් ලාභය රු.25,973,168.00ක් විය. සමාලෝචිත මුදල් වර්ෂය තුළ සමාගම විසින් ලද මූල්‍ය ආදායම රු.4,685,120.00 විය. සමාගම විසින් රුපියල් 29,969,674.00 ක ශුද්ධ ලාභයක් වාර්තා කරනු ලැබ ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රුපියල් 100,000,000/- ක් වූ අතර සාමාන්‍ය කොටස් ප්‍රමාණය 10,000,000ක් වන සමාගමේ කොටස් හිමිකමෙන් 100%කම අයිතිය ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් දරනු ලබයි.

ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ සම්බන්ධතා

අධ්‍යක්ෂකවරුන්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 192 වැනි වගන්තියෙහි දැක්වෙන විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කර ඇත.

විගණකවරුන්

ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයන්ට අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුව තවදුරටත් විගණකවරයා ලෙස කටයුතු කරනු ඇත.

සමාගම් ලේකම්වරු

එස්. එස්. පි. කෝපරේට් සේවය තවදුරටත් ලේකම්වරු ලෙස කටයුතු කරනු ඇත.

ලියාපදිංචි කාර්යාලය

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හල්ස්ඩෝර්ෆ් මිල්ස්, කොළඹ 12 ස්ථානයේ පිහිටා ඇත.

.....	.....	.....
ඩබ්.එම්.එස්.සී. වෙලේගම මහතා	එම්. පී. ඩබ්ලිව්. කරුණාරත්න මහතා	එස්.එස්.පී. කෝපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගම
සභාපති	අධ්‍යක්ෂක	ලේකම්වරු

2021.04.29

බී සී සී ලංකා ලිමිටඩ්

බීසීසී ලංකා ලිමිටඩ් සමාගම සතු ප්‍රධාන නිෂ්පාදන පහසුකම් වනුයේ සබන් කර්මාන්ත ශාලාව සහ පොල්තෙල් පිරිපහදුවයි. මෙම යන්ත්‍රාගාර මගින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයන්ගේ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

1. සබන් කර්මාන්ත ශාලාව

රෙදි සෝදන සබන්, ඇඟ ගල්වන සබන්, විෂ බීජ නාශක සහ පවිත්‍රකාරක මෙම සබන් කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය කෙරේ. එම නිෂ්පාදන ඒවායෙහි වෙළඳ නාමයන් සමඟ පහත දක්වා ඇත.

1) ඇඟ ගල්වන සබන් - සඳුන්
   සුවේන්ද්‍රා මල් සුවඳැති
   සුවේන්ද්‍රා ශාකසාර
   හෙල්ත් ජෝයි

2) රෙදි සෝදන සබන් - සවරින් බාර්
   ස්නෝ-වයිට්

3) විෂබීජ නාශක - ෆයිනෝල්
   ටොයිලට් බඳුන් පිරිසිදුකාරක

4) පවිත්‍රකාරක - පිඟන් සෝදන දියර
   පිඟන් සෝදන කුඩු

5) එයාර් ෆ්‍රෙෂ්නර්

2. පිරිපහදු නිෂ්පාදන

සුදු පොල් තෙල්, කුක්ස් ජෝයි යන වෙළඳ නාම යටතේ පොල් තෙල් මෙම පිරිපහදුවෙහි නිෂ්පාදනය කෙරේ. පහත සඳහන් ඇසුරුම් ප්‍රමාණයන්ගෙන් මෙම නිෂ්පාදන අලෙවි කරනු ලැබේ.

කුක්ස් ජෝයි - මිලි ලීටර් 500, ලීටර් 01, ලීටර් 5, ලීටර් 20

සුදු පොල් තෙල් - මිලි ලීටර් 500, ලීටර් 01, ලීටර් 5, ලීටර් 20

විගණන කළමණාකරණ කමිටු වාර්තාව 2019/2020

2020 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා විගණන කමිටුවෙහි සංයුතිය පහත පරිදි වේ. තවද වසර තුලදි විගණන කමිටු රැස්වීම් 02 පමණක් පවත්වා ඇත.

1. ඒ. ආර්. වික්‍රමසිංහ මෙනවිය - සභාපතිනිය
2. ඒ. ඩී. ජී. සිල්වා මහතා - සාමාජික
3. පී. එච්. සොලමන් මහතා - සාමාජික

2019 වසර තුලදී කමිටුව

- සමාගමේ මෙහෙයුම් කටයුතු පහසු කරගැනීම පිණිස තොග, නිෂ්පාදන ක්‍රියාවලිය, ණය, මානව සම්පත්, ආදායම්, වියදම්, ගෙවීම්, ස්ථාවර වත්කම් හා මිලදීගැනීම් නිරීක්ෂණය කරන ලද අතර අන්තර් පාලන ක්‍රියාවලිය ප්‍රමාණවත් කරනු පිණිස නිර්දේශ නිකුත් කරන ලදි.

- මූල්‍ය වාර්තාකරණයේ හා සමස්ථ අන්තර් පාලන පද්ධතියේ ප්‍රමාණාත්මතාවය පරීක්ෂා කරන ලදි.

- මානව සම්පත් කළමණාකරණය හා පෞද්ගලික වේතන සම්බන්ධව විගණන ජනරාල්තුමාගේ වාර්තාවෙහි කරුණු සම්පව පරීක්ෂා කරන ලදි.

- 2017/2018 විගණකාධිපතිවරයාගෙ වාර්තාවේ සඳහන් ගිණුම්කරණ දුර්වලතාවයන්, නීති හා රෙගුලාසි වලට පටහැනි ක්‍රියාවන් හා කළමණාකරණ දුර්වලතාවයන් නිවැරදි කරන ලදි.

කෙසේ නමුත් අධ්‍යක්ෂක මණ්ඩල පත්වීම් ප්‍රමාද වූ බැවින් සුලු විගණන කමිටු රැස්වීම් ප්‍රමාණයක් පවත්වන ලදි. තවද අධ්‍යක්ෂක මණ්ඩලයට නියමිත ගිණුම්කරණ ප්‍රමිත, නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව මූල්‍ය වාර්තා අධීක්ෂණය කරනු පිණිස උපකාර කරන ලදි.

ඒ.ආර්. වික්‍රමසිංහ
සභාපතිනිය
විගණන කළමණාකරණ කමිටුව

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව
ජාතික විගණන කාර්යාලය

මගේ අංකය :- IMU/A/BCC/FA/01/2020 ඔබේ අංකය :- දිනය 2021 මාර්තු 05

සභාපති
බීසීසී ලංකා සමාගම

බීසීසී ලංකා සමාගමේ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බීසීසී ලංකා සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ, විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) දේපල, පිරියත හා උපකරණ පරිච්ඡේද අංක 51 අනුව වත්කම් වල ඵලදායී ජීවකාලය අවම වශයෙන් එක් එක් ගිණුම් වසරවල අවසානයේදී නැවත පරීක්ෂා කල යුතු අතර වෙනස්කමක් පවති නම් ගිණුම්කරණ ප්‍රමිත 08 (LKAS 08) අනුව ගිණුම් ගතකල යුතුය. කෙසේ නමුත් සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද රථවාහන හා ගොඩනැගිලි පිළිවෙලින් පිරිවැයට රු.28,018,179 හා රු.1,924,915 වූ වත්කම් තවමත් පරිහරණය කරන නමුදු වාර්ෂික පරීක්ෂා කිරීමක් හා ගිණුම් ගත කිරීමක් කර නොමැත.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 (LKAS 12) ආදායම් බදු පරිච්ඡේද අංක 80 හා 81 අනුව විලම්බිත ආදායම් බදු සඳහා සටහන් තුල කල යුතු හෙළිදරව් කිරීම් කර නොමැත.

(ඇ) වර්ෂ දහ තුනකට අධික කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන එකතුව රු.57,648,266ක් වූ පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, භාණ්ඩ හා සේවා බදු, වරිපනම් හා බදු සහ අගය එකතුකළ බදු යනාදී දිගුකාලීනව ගෙවිය යුතුව පවත්නා ශේෂයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ අදාල විගණන සාක්ෂි නොපැවතීම නිසා විගණනයේදී ඒවායෙහි නිවැරදිතාව සනාථ කරගැනීමට නොහැකි විය.

(ඈ) සමාගමේ මූල්‍ය ප්‍රකාශය අනුව, 2020 මාර්තු 31 දිනට ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු මුදල රු.4,508,266ක් විය. එහෙත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශය අනුව සමාගමෙන් ලැබිය යුතු එවැනි ශේෂයක් දක්වා නොතිබුණි. එබැවින්, මෙම ගෙවිය යුතු ශේෂයේ විශ්වසනීයත්වය සහ පැවැත්ම පිළිබඳව විගණනයේදී සෑක සහිත වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමණාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශ, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවධානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් නිරීක්ෂණ

- කැබිනට් පත්‍රිකා අංක- අමප./15/1874/702/010, 2015.12.09 දින දරණ, අංක-අමප/16/0597/731/009-1, 2016.04.26 දින දරණ හා අංක-අමප/16/1277/724/052,2016.07.12 දින දරණ පත්‍රිකා මගින් කොළඹ අධිකරණ සංකීර්ණයක් ගොඩනැගීම සඳහා අක්කර 06ක භූමිය ලබාදීමට අනුමැතිය ලබා දී ඇත. අක්කර 12 වූ සමස්ථ භූමියෙන් අක්කර 04 කොටසක් බන්ධනාගාර

මූලස්ථානය ඉවත් කිරීම හේතුකොටගෙන රිමාන්ඩ් බන්ධනාගාරය පිහිටු වීම සඳහා ද තවත් අක්කර 02 රූඩ් 03 පර්චස් 8.77 කොටසක් නාගරික සංවර්ධන අධිකාරියට වාණිජ කටයුතු සඳහා ලබාදී ඇත. කෙසේනමුත් ඉහත සඳහන් රූඩ් 03 පර්චස් 8.77 කොටස බි සි සි ලංකා සමාගමට අයිතිය ඇති නමුදු මෙතෙක් රාජ්‍ය ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාපටිපාටිය අනුව දිසා ලේකම්ට 2019.04.11 වන දින කරන ලද මෙම පැවරීමට අදාලව මෙතෙක් හානි පූර්ණයක් කර නොමැත.තවද ඉතුරු අක්කර 06 රූඩ් 03 පර්චස් 8.77 ඉඩම 2013 සිට මේ දක්වා නැවත අගය කිරීමක් කර නොමැති අතර 2016.07.12 දින අංක-අමප/16/1277/724/052 දරන අක්‍රීය අමාත්‍ය මණ්ඩල සංදේශය ද මේ දක්වා අවලංගු කර නොමැත.

- සමාගම විසින් 1985, 2002 හා 2004 යන වසර වල පොල් සංවර්ධන අධිකාරියෙන් රු.58,265,037 ණය මුදලක් ද වර්ෂ 2003 රු:10,000,000 ණය මුදලක් කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව මගින් ලබාගෙන ඇති අතර මේ සඳහා සලකා බලන වසර තුල ගෙවිය යුතු මුලු පොලී වියදම රු.94,788,727කි. කෙසේ නමුත් 2020.03.31 දිනට ගෙවිය යුතු සමස්ථ පොලී වියදම හා ප්‍රාග්ධන ගෙවීම් වල එකතුව රු.163,053,764 වූ නමුත් මෙතෙක් එය පියවා දමා නොමැත.

- ආපසු ගෙවනු ලබන කුලී බදු අත්තිකාරම් මුදල් 09 එකතුව වූ රු.1,949,142 කුලී ගැනුම්කරුවන් විසින් නැවත අයකරගෙන නොමැති අතර පසුගිය වසර 10ක කාලය තුල ගබඩා පහසුකම්ද ලබාගෙන නොමැත. කෙසේ නමුත් මෙම මුදල් නැවත පියවා දැමීමට කිසිදු ක්‍රියාකාරකමක් කර නොමැත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

බී.සී.සී. ලංකා සමාගම

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

මාර්තු මස 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2020 රු. ශත.	2019 රු. ශත.
ආදායම	**04**	**251,632,204**	256,454,684
විකුණුම් පිරිවැය	**05**	**(142,335,712)**	(164,078,442)
දළ ලාභය		**109,296,491**	92,376,242
වෙනත් මෙහෙයුම් ආදායම්	**06**	**369,290**	772,204
පරිපාලන වියදම්	**07**	**(72,097,522)**	(67,694,696)
බෙදාහැරීමේ වියදම්	**08**	**(11,595,091)**	(9,571,062)
මෙහෙයුම් කටයුතුවලින් ලද ලාභය	**09**	**25,973,168**	15,882,689
මූල්‍ය ආදායම	**10**	**11,476,899**	9,410,841
මූල්‍ය වියදම්	**11**	**(6,791,779)**	(6,809,142)
ශුද්ධ මූල්‍ය ආදායම		**4,685,120**	2,601,699
බදුකරණයට පෙර ලාභය		**30,658,288**	18,484,388
ආදායම් බදු ආපසු හැරවීම/(වියදම්)	**12**	**(688,614)**	-
වර්ෂයේ ලාභය		**29,969,674**	18,484,388
වෙනත් විස්තීර්ණ ආදායම්			
විශ්‍රාම ප්‍රතිලාබ බැඳීම් ආයුගනක ලාභ අලාභ	**22**	**33,072**	-
වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම		**30,002,746**	**18,484,388**
		-	-

මෙම මූල්‍ය ප්‍රකාශන වල 13 සිට 24 දක්වා පිටු වල සටහන් අත්‍යවශ්‍ය අංගයක් වේ.
වරහන් වල දැක්වෙන ඉලක්කම් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ.

බී.සී.සී. ලංකා සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මාර්තු මස 31වන දිනට

	සටහන්	**2020**	2019
		රු. ශත.	**රු. ශත.**
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**13**	**8,207,429,151**	8,206,567,124
සිදු කෙරෙමින් පවත්නා කාර්යයන්	**14**	**-**	1,924,992
අලෙවිය සඳහා පවත්නා - ආයෝජන	**15**	**240,000.0**	240,000
		8,207,669,151	8,208,732,116
ජංගම වත්කම්			
භාණ්ඩ තොගය	**16**	**27,606,607**	37,271,613
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	**17**	**61,818,176**	56,822,862
පවත්නා බදු වත්කම්	**18**	**5,955,807**	3,984,907
මුදල් හා මුදල් සාමාග්‍යයන්	**19**	**169,041,839**	124,547,615
		264,422,429	222,626,997
මුළු වත්කම්		**8,472,091,580**	8,431,359,113
හිමිකම් /ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**20**	**100,000,000**	100,000,000
සංචිත	**21**	**8,193,775,600**	8,193,775,600
රඳවාගත් ඉපැයුම්		**(94,570,262)**	(124,573,008)
හිමිකම් එකතුව		**8,199,205,338**	8,169,202,592
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම	**22**	**9,857,398**	7,904,356
ණය හා ණය ගැනීම්	**23**	**163,053,764**	156,306,243
		172,911,163	164,210,599
ජංගම බැරකම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	**24**	**99,975,079**	97,945,921
		99,975,079	97,945,921
මුළු ජංගම බැරකම්		**272,886,242**	262,156,521
මුළු හිමිකම් සහ බැරකම්		**8,472,091,580**	8,431,359,113

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි

5 වන පිටුවේ සිට 12 වන පිටු දක්වා වූ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 13 වන පිටුවේ සිට 24 දක්වා වූ මුල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මෙම මුල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇතිබව සහතික කරමි.

එස් එම් සි ඩබ්ලිව් රංජන්
සාමාන්‍යාධිකාරී

මෙම මුල්‍ය කටයුතු සකස් කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ
මණ්ඩලය වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලද ප්‍රකාශ.

ඩබ්ලිව් එම් එස් සී වෙලේගම
සභාපති / අධ්‍යක්ෂක

එම් පී ඩබ්ලිව් කරුණාරත්න
අධ්‍යක්ෂක

දිනය: .....

බී.සී.සී. ලංකා සමාගම

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2020 මාර්තු මස 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය **රු. ශත.**	ප්‍රත්‍යාගණන සංචිත **රු. ශත.**	රඳවාගත් ඉපැයුම් **රු. ශත.**	එකතුව **රු. ශත.**
2018 අප්‍රේල් මස පළමුවැනි දිනට ශේෂය	100,000,000	8,193,775,600	(143,057,396)	8,150,718,204
වර්ෂයේ ලාභය	-	-	18,484,388	18,484,388
2019 අප්‍රේල් මස පළමුවැනි දිනට ශේෂය	**100,000,000**	**8,193,775,600**	**(124,573,008)**	**8,169,202,592**
වර්ෂයේ ලාභය	-	-	29,969,674	29,969,674
වර්ෂයේ වෙනත් විස්තීර්ණ ආදායම්			33,072	33,072
2020 මාර්තු මස 31වන දිනට ශේෂය	**100,000,000**	**8,193,775,600**	**(94,570,262)**	**8,199,205,338**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.
පිටු 5 සිට 12 දක්වා වූ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 13 සිට 24 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

බී.සී.සී. ලංකා සමාගම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මාර්තු මස 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	**2020** රු. ශත.	2019 රු. ශත.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය			
බදුකරණයට පෙර ශුද්ධ ලාභය/(අලාභය)		**30,658,288**	18,484,388
පහත කරුණු සඳහා ගැළපීම් -			
දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය වීම්	**13**	**3,294,180**	5,560,831
ක්‍රමක්ෂය කිරීම	**14**	**1,924,992**	962,496
ස්ථාවර තැන්පතු පොළිය	**10**	**(11,476,899)**	(9,410,841)
විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	**22**	**1,986,114**	1,848,289
ණය පොළිය	**11**	**6,747,521**	6,747,521
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය /(අලාභය)		**33,134,196**	24,192,684
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්			
භාණ්ඩ තොගවල වැඩිවීම	**16**	**9,665,006**	9,205,677
වෙළඳ හා වෙනත් ලැබිය දෑ වැඩිවීම /අඩුවීම	**17**	**(6,966,214)**	(6,006,835)
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම /(අඩුවීම)	**24**	**2,029,149**	(98,198)
මෙහෙයුම් කටයුතුවලින් ලද/ (ඒ සඳහා යොදවන ලද) මුදල්		**37,862,137**	27,293,328
ගෙවන ලද සේවක ප්‍රතිලාභ		**-**	(590,409)
මෙහෙයුම් කටයුතුවලින් ලද/(ඒ සඳහා භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රමාණය		**37,862,137**	26,702,919
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම	**13**	**(4,156,197)**	(2,191,413)
භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය		**-**	-
ලද පොළිය	**10**	**11,476,899**	9,410,841
ආයෝජන කටයුතුවලින් ලද/ (ඒ සඳහා යොදවන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		**7,320,702**	7,219,428
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
ගෙවූ පොළිය		**-**	-
ESC ගෙවීම්	**18**	**(688,614)**	-
මූල්‍ය කටයුතුවලින් ලද/ (ඒ සඳහා යොදවන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		**(688,614)**	-
මුදල් සහ මුදල් සාම්‍යයන්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම)		**44,494,225**	33,922,348
වර්ෂය ආරම්භයේදී පැවති මුදල් සහ මුදල් සාම්‍යයන්		**124,547,615**	90,625,266
වර්ෂය අවසානයේදී පැවති මුදල් සහ මුදල් සාම්‍යයන්		**169,041,839**	124,547,614
වර්ෂය අවසානයේදී පැවති මුදල් සහ මුදල් සාම්‍යයන් විශ්ලේෂණය			
ජාතික සංවර්ධන බැංකුව	**19**	**-**	1,277,921
මහජන බැංකුව	**19**	**34,777,663**	18,763,984
අතැති මුදල්	**19**	**132,073**	214,000
කෙටි කාලීන ආයෝජන - මහජන බැංකුව	**19**	**134,132,103**	104,291,710
		169,041,839	124,547,615

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.

පිටු 5 සිට 12 දක්වා වූ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 13 සිට 24 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී පිළිගනු ලැබූ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ :

1. ආයතනික තොරතුරු

1.1 ලියාපදිංචිය සහ නෛතික තත්ත්වය

බීසීසී ලංකා සමාගම, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කොට සංස්ථාගත කොට ඇති සීමාසහිත වගකීමැති සමාගමකි. ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ කොළඹ 12, මිරාණියා වීදිය, හල්ස්ඩොර්ෆ් මිල්ස් යන ස්ථානයේය.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- පොල්තෙල් වෙළඳාම
- ඇඟ ගල්වන සබන්, රෙදි සෝදන සබන්, පවිත්‍රකාරක සහ ටොයිලට් පිරිසිදුකාරක නිෂ්පාදනය කිරීම සහ වෙළඳාම
- ගොඩනැගිලි කුලියට දීම

2 සකස්කිරීමේ පදනම

2.1 අනුකූලත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් දෑ හැර 2020 මාර්තු 31වන දිනට සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (“මූල්‍ය ප්‍රකාශ”) සමඟ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම්වල වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLRFSs හා LKASs) හා වරලත් ගණකාධිකාරී ආයතනයේ නියමයන්ට හා 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2.2 අගය කිරීමේ පදනම

අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කොට ඇත්තේ උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය නියමයට අනුකූලවය.

2.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් යොදාගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති, අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුරූපී වේ. පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය තැන්හිදී, පෙර වර්ෂවල සංඛ්‍යා සහ වාක්‍ය සටහන් නැවත පිළියෙල කරනු ලැබ ඇත.

2.4 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් පසුව හටගත් සිද්ධීන්

සියලුම භෞතික සිද්ධීන් සළකා බලනු ලැබ ඇති අතර, මෙම මූල්‍ය ප්‍රකාශවල ඒ සඳහා සුදුසු ගැලපීම් සහ අනාවරණය කිරීම් සිදුකර ඇත.

2.5 භාවිත හා පිළිගැන්වීමේ මුදල් ඒකකය

සියලු මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් මඟින් ඉදිරිපත් කර ඇත. සමාගමේ ගණුදෙනුකරන හා වාර්තා ඉදිරිපත් කරන මුදල් ඒකකය රුපියල් වේ. අන්‍යාකාරයකින් සඳහන් කර නොමැති විට සියලුම මූල්‍ය වාර්තා ආසන්න රුපියලට වටයා ඇත.

2.6 භෞතිකත්වය හා ඒකරාශීකරණය

සමාන එක් එක් භෞතික පන්තියේ අයිතම වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශ තුල දක්වා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) අනුව අභෞතික අසමාන ස්වභාව හෝ ක්‍රියාවන් වෙන්ව මූල්‍ය ප්‍රකාශ තුල පෙන්වා ඇත.

2.7 මූල්‍ය වාර්තා අනුමැතිය

2020 දෙසැම්බර් XX දින අධ්‍යක්ෂක මණ්ඩල යෝජනාවට අනුව 2020.03.31 දිනෙන් අවසන් වසර සඳහා පිළියෙල කල මූල්‍ය වාර්තා ප්‍රසිද්ධ කිරීමට අනුමැතිය හා බලය ලබා දී ඇත.

2.8 මූල්‍ය වාර්තා පිලිබඳ වගකීම

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරිම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වගකීමකි.

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එම වගකීම් පිළිගන්නා අතර එම වගකීම් තුල පහත දැ අතුලත් වේ.

- වසර අවසාන දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ තොරතුරු
- මුදල් හා මුදල් වලට සමාන දැ වල වෙනස්වීම පිලිබඳ තොරතුරු
- ප්‍රතිපත්ති හා පැහැදිලිකිරීම් සමඟ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන්

2.9 තක්සේරුව හා විනිශ්චය භාවිතය

SLFRS හා LKAS වලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වයට විවිධ උපකල්පන, නිගමන හා තක්සේරු කිරීම් වලට එළඹීමට සිදුවන අතර මෙමගින් වාර්තා කරන ලද වත්කම්, වගකිම්, ආදායම්,වියදම් හා ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට බලපෑමක් ඇතිවිය හැක. සත්‍යය අගයන් වාර්තාගත අගයන්ට වඩා වෙනස් විය හැක.

තක්සේරු කිරීම් හා උපකල්පන කාලානුරූපීව නැවත පරීක්ෂා කරනු ලැබේ. තක්සේරු ආපසු හැරවීම් අදාළ වසරට සහ අදාළ නම් ඉදිරි වසර වලටද අදාළ වන පරිදි ගලපනු ලැබේ.

මූල්‍ය වාර්තා තුල හඳුනා ගනු ලබන අතිශය වැදගත් විටිනාකම් වලට අදාළ තක්සේරු කිරීම්, උපකල්පන හා තීන්දු වෙනමම සටහන් මගින් පහත අයිතම යටතේ දක්වා ඇත.

- සේවක විශ්‍රාම ප්‍රතිලාභ සටහන්
- දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීම්
- කපාහැරීම් වලට අදාළ වෙන් කිරීම්

2.10 අඛණ්ඩ පැවැත්ම

කළමණාකාරීත්වය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ඇගයීමක් කර ඇති අතර ආයතනය සතු සම්පත් දැකිය හැකි අනාගතයක් දක්වා ව්‍යාපාර කටයුතු කිරීමට ප්‍රමාණවත් වීම ගැන තෘප්තිමත්ය. තවද අඛණ්ඩ පැවැත්මට පටහැනි අවිනිශ්චිතතාවයන් පිලිබඳව කළමණාකාරීත්වය දැනුවත් නොමැති බැවින් සමාගමේ ගිණුම් අඛණ්ඩ පැවැත්ම මත පිහිටා තවදුරටත් පිළියෙල කර ඇත.

2.11 වාර්තා කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා සකස් කරන දිනයන් හා අනුමත කරනු ලබන දිනයන් අතර සිදුවන වාසිදායක හා අවාසිදායක සිදුවීම මූල්‍ය වාර්තා වලට පසු සිදුවීම් වේ. මූල්‍ය වාර්තා වලට පසු සියලුම භෞතික හා වැදගත් සිදුවීම් සලකා බලා අදාළ හෙලිදරව් කිරීම් කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

අන්‍යාකාරයකින් සඳහන් කර නොමැති විට හැරුනුකොට සමාගම විසින් පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුගමනය කර ඇත.

3.1 දේපළ, පිරියත සහ උපකරණ

3.1.1 පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ සඳහා එකතු කරන ලද ක්ෂයවීම් හා එකතු වූ දුර්වලතා අලාභයන් සඳහා අඩු කිරීම් කර පිරිවැයට දක්වා ඇත. දේපල, පිරියත සහ උපකරණ වල සියළුම අයිතමයන් මුල් මිල ගණන් යටතේ සටහන් වේ.

දේපල, පිරියත සහ උපකරණ වල පිරිවැය යනු අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීමේ පිරිවැය සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි තත්ත්වයට ගෙන ඒම සඳහා වන ඕනෑම වියදමක් සමඟ ය.

3.1.2 පසු පිරිවැය

දේපල, පිරියත සහ උපකරණවල යම් අංගයක් ආදේශ කිරීමේ පිරිවැය පසුව එම කොටස තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමට ඉඩ තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැන ගත හැකි නම් අයිතමයේ රැගෙන යන ප්‍රමාණයෙන් පිළිගනු ඇත. දේපල, පිරියත සහ උපකරණ සඳහා එදිනෙදා සේවා පිරිවැය විස්තිර්ණ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

3.1.3 ක්ෂය වීම්

සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් වත්කම්වල පිරිවැය (සින්නක්කර ඉඩම් හැර) ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට කපා හැරීම සඳහා ක්ෂයවීම් ලාභයට හෝ අලාභයට අය කෙරේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය, අවශේෂ අගයන් සහ ක්ෂයවීම් ක්‍රමය සෑම වසරකම සමාලෝචනය කරනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ සඳහා ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ;

ස්පෘශ්‍ය වත්කම් පන්තිය	**ප්‍රයෝජනවත් ජීවිත කාලය**
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 10
ගොඩනැගිලි	අවුරුදු 20
මෙවලම් සහ උපකරණ	අවුරුදු 04
මෝටර් රථය	අවුරුදු 04
කාර්යාල උපකරණ	අවුරුදු 04
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	අවුරුදු 04

වත්කමක ක්ෂය වීම එය භාවිතය සඳහා ලබා ගත හැකි වූ විට ආරම්භ වන අතර වත්කම විකිණීම සඳහා තිමි යැයි වර්ගීකරණය කළ දිනට පෙර සහ වත්කම අවලංගු කළ දින සිට නැවැත්වේ. ක්ෂයවීම් ක්‍රම, ප්‍රයෝජනවත් ජීවිත සහ අවශේෂ අගයන් එක් එක් වාර්තා කිරීමේ දිනයේදී සමාලෝචනය කර සුදුසු නම් සකස් කරනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණවල වාර්ෂික ක්ෂයවීම නිෂ්පාදන හා සේවා අංශවලට පහත සඳහන් අනුපාතවලට බෙදීමට සමාගම තීරණය කරයි.

ස්ථාවර වත්කම් පන්තිය	**නිෂ්පාදන අංශය**	**සේවා අංශය**
පිරියත සහ යන්ත්‍රෝපකරණ	70%	30%
ගොඩනැගිලි	40%	60%
මෙවලම් සහ උපකරණ	30%	70%
මෝටර් වාහන	-	100%
කාර්යාල උපකරණ	-	100%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	-	100%

3.1.4 ණයට ගැනීමේ පිරිවැය

වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සම්බන්ධව සෘජුවම ආරෝපණය කළ යුතු පිරිවැය, අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීම සඳහා සැලකිය යුතු කාලයක් අවශ්‍ය වන අතර ඒ ඒ වත්කම් වල වටිනාකමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇත. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා සිදුවන කාලය තුළ වියදම් කරනු ලැබේ. ණය ගැනීමේ පිරිවැය සමන්විත වන්නේ අරමුදල් ණයට ගැනීම සම්බන්ධව ආයතනයක් දරන පොලී සහ අනෙකුත් වියදම් වලිනි.

3.1.5 ප්‍රත්‍යාගණනය

සමාගම අවම වශයෙන් සෑම වසර පහකට වරක්වත් තම ඉඩම සහ ගොඩනැගිලි නැවත ඇගයීමට ලක් කරයි, නැවත ඇගයීමේදී එහි සාධාරණ අගයෙන් එකතු කරන ලද ක්ෂය වීම සහ එකතු වූ දුර්වලතා පාඩු අඩු කර මනිනු ලැබේ.

3.2 අස්පෘශ්‍ය වත්කම්

3.2.1 හඳුනාගැනීම සහ මැනීම

අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබීමට ඉඩ තිබේ නම්, වත්කම්වල පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම් LKAS 38 " අස්පෘශ්‍ය වත්කම් '' සමඟ අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ඇත. සීමිත ප්‍රයෝජනයක් සහිත අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත දුර්වලතා පාඩු අඩු කර මනිනු ලැබේ.

3.2.2 පසුකාලීන වියදම්

පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය සම්බන්ධ නිශ්චිත වත්කම තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කළ විට පමණි. අභ්‍යන්තරව ජනනය කරන ලද කීර්තිනාමය සඳහා වන වියදම් ඇතුළුව අනෙකුත් සියලුම වියදම් ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මඟින් හඳුනාගෙන ඇත.

3.2.3 ක්‍රමක්ෂය

කීර්තිනාමය හැරුනු කොට ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය හඳුනාගනු ලබන්නේ සරල රේඛීය පදනමක් මත ඒවා භාවිතයට ගත හැකි දින සිට ප්‍රයෝජනවත් ජීවිත කාලයටය.

3.2.4 අවතක්සේරු කිරීම

අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීම හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති විට හඳුනා නොගනී

3.3 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

3.3.1 නිශ්චිත දායකත්ව සැලැස්ම

